# පානදුර බාලිකා මහා විද්‍යාලය - කළුතර

## වාර අවසාන පරීක්ෂණය 2018 නොවැම්බර්

## 12 ශ්‍රේණිය

**ඉන්දියා ඉතිහාසය** **25A-S-1**

ඉන්දියා ඉතිහාසය(ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1206 දක්වා)
සැලකිය යුතු යි.
* සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

ප්‍රශ්න අංක 1-10 තෙක් ප්‍රශ්න වලට නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් මත අනෙක් නම් මත නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැ'යි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

**01** (01) කයිබර් (02) බෝලාන් (03) මක්‍රාන් (04) ථාර් (05) බැරෝඩා (..........)

**02** (01) නිල්ගිරි (02) කාඩමන් (03) රායිචූර් (04) කාර්කෝරම් (05) ඇරකන්යෝමා (..........)

**03** (01) ඒ. එල්. බෂාම් (02) දයාරාම් ශානි (03) ආර්. ඩී. බැනර්ජි (04) ජෝන් මාෂල් (05) වසන්ත් සින්දේ (..........)

**04** (01) පැති බැමි යුගලය (02) ඉහළ ආවරණය (03) මනුබිල (04) පහන් කුළුණු (05) ජලපිවිසුම් කවුළු (..........)

**05** (01) 16 (02) 32 (03) 50 (04) 64 (05) 80 (..........)

**06** (01) ජගන්මාතා (02) පුරුෂ දෙවියා (03) වෘක්ෂ (04) සත්ත්ව (05) මහා බ්‍රහ්මන් (..........)

**07** (01) මොහෙන්ජොදාරෝ (02) හරප්පා (03) රාජපගෘහ (04) රඛිගාර්හි (05) ධොලවීර (..........)

**08** (01) ඔස්ට්‍රොලොයිඩ් (02) නිග්‍රොයිඩ් (03) මධ්‍යධරණී (04) මොංගොලොයිඩ් (05) ඇල්පයින් (..........)

**09** (01) ඇතා (02) දිවියා (03) ගවයා (04) අශ්වයා (05) කඟවේනා (..........)

**10** (01) වෛශ්‍ය (02) දිගම්බර (03) ක්ෂුද්‍ර (04) ක්ෂත්‍රීය (05) බ්‍රාහ්මණ (..........)

අංක 11-15 තෙක් ප්‍රශ්න වල පද යුගල 5 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. ඒ නොගැළපෙන යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**11**
(01) යමුනා - ගංගා
(02) චම්බාල් - යමුනා
(03) පෙන්නාර් - කාවේරි
(04) තුංගභද්‍රා - ක්‍රිෂ්ණා
(05) කේඩලම් - සින්ධු (..........)

**12**
(01) බටහිර ඝාට්ස් - ක්‍රිෂ්ණා
(02) වින්ද්‍යා - චම්බාල්
(03) සත්පුර - බියස්
(04) හින්දුකුෂ් - කාබුල්
(05) නිල්ගිරි - කාවේරි (..........)

13 (01) ඉන්ද්‍රප්‍රස්ථ - යමුනා

(02) පාඨලීපුත්‍ර - ගංගා

(03) රාජගෘහ - මහානදී

(04) තක්ෂිලා - සින්ධු

(05) උදේනි - චම්බාල් (..........)

14 (01) කයිබර් - හින්දුකුෂ්

(02) බෝලාන් - සුලෙයිමාන්

(03) මක්‍රාන් - කාර්කෝරම්

(04) බැරෝඩා - වින්දයා

(05) පාලඝාට් - නිල්ගිරි (..........)

15 (01) අලහබාද් ප්‍රශස්තිය - හරිශේන

(02) මුද්‍රාරාක්ෂසය - වසුබන්ධු

(03) කතාසරිත්සාගරය - සෝමදේව

(04) කුමාර සම්භව - කාලිදාස

(05) දශකුමාර චරිත - දණ්ඩින් (..........)

අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයන්හි නාම/ප්‍රකාශන/ දිනවකවානු සමූහයක් X හා Y තීරු වල දී ඇත. Y තීරුවේ ඇති නාම/ප්‍රකාශන/ දිනවකවානු X තීරුවේ ඇති ඒවා හා කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළ සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය වරහන තුළ ලියන්න.

16

| X | Y |
|---|---|
| (01) ක්‍රිෂ්ණා නදිය | A වයඹ සිට ගිනිකොණට |
| (02) නර්මදා නදිය | B නැගෙනහිර සිට බටහිරට |
| (03) සෝණ නදිය | C දකුණේ සිට උතුරට |
| (04) ගෝග්‍රා නදිය | D බටහිර සිට නැගෙනහිරට |
| (05) ගංගා නදිය | E උතුරේ සිට දකුණට |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

17

| X | Y |
|---|---|
| (01) නිල්ගිරි | A මධ්‍ය ඉන්දියාව |
| (02) වින්දයා | B උතුරු ඉන්දියාව |
| (03) හින්දුකුෂ් | C දකුණු ඉන්දියාව |
| (04) හිමාලය | D ඊසාන ඉන්දි යාව |
| (05) නාගාලන්ත | E වයඹ ඉන්දියාව |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

18

| X | Y |
|---|---|
| (01) සුප්පාරක | A කැම්බේ බොක්ක |
| (02) කාවේරි පටුන | B බෙංගාල බොක්ක |
| (03) තාම්‍රලිප්ති | C කොරමැණ්ඩල් වෙරළ |
| (04) භාරුකච්ඡ | D ගෝල්කොණ්ඩා වෙරළ |
| (05) විශාඛ පටුන | E මලබාර් වෙරළ |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

**19** X Y

| X | Y |
|---|---|
| (01) තක්ෂිලා | A වින්ධ්‍යා කඳු |
| (02) කනෞජ් | B රායිචූර් දෙගම්මැදිය |
| (03) අයිහෝල් | C ගංගා යමුනා දොආබ් |
| (04) උජ්ජේනි | D කාතියවාර් අර්ධද්වීපය |
| (05) ජුනගාඩ් | E පංජාබය |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

**20** X Y

| X | Y |
|---|---|
| (01) යජුර් වේදය | A සංගම් සාහිත්‍යය |
| (02) අග්ගඤ්ඤ සූත්‍රය | B වෛදික සාහිත්‍යය |
| (03) සාමාවතී සූත්‍රය | C ජෛන සාහිත්‍යය |
| (04) තෝල්කාප්පියම් | D බෞද්ධ සාහිත්‍යය |
| (05) විෂ්ණු පුරාණය | E හින්දු සාහිත්‍යය |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**21** හරප්පා නගරය

(01) ඉන්දුනිම්න ශිෂ්ටාචාරයට අයත් නගරයකි
(02) රාවි නදීබඩ පිහිටා තිබේ
(03) වත්මන් පංජාබයට අයත් වේ
(04) ඉන්දුනිම්න ශිෂ්ටාචාරයට අයත් නගර අතරින් පළමුව හමු වූ නගරය වේ
(05) පසුකාලීනව ඉන්ද්‍රප්‍රස්ථ ලෙස නම වෙනස්විය (..........)

**22** ඉන්දුනිම්න ආර්ථිකය

(01) කෘෂිකර්මය මත පදනම් විය
(02) වාණිජ බෝග වශයෙන් කෝපි හා කොකෝවා වගා කර ඇත
(03) වෙළඳ කටයුතු ද සිදුකර ඇත
(04) පේෂ වඩු කුඹල් ආදී කර්මාන්ත ද සුළු වශයෙන් තිබී ඇත
(05) සත්ත්වපාලනය යටතේ එළුවා ගවයා වැනි සතුන් ඇතිකර තිබේ (..........)

**23** ඉන්දුනිම්න ශිෂ්ටාචාරයට අයත් වරාය

(01) ලෝතාල් ප්‍රධාන වරායක් සේ පිළිගැනේ
(02) සුක්තජෙන්දෝර් වරාය මහා ඇලෙක්සැන්දර් අධිරාජයා විසින් භවිත කර ඇත
(03) සුක්තජෙන්දෝර් හා සුක්තකෝ වැනි වරායන් අරාබි මුහුදට මුහුණලා පිහිටා තිබේ
(04) ලෝතාල් වරායට පිවිසීමට කැම්බේ බොක්කේ සිට ඇළමගක් තිබී ඇත
(05) සුක්තජෙන්දෝර් හා සුක්තකෝ වැනි වරායන් ඔස්සේ විදෙස් සබඳතා පවත්වා ඇත (..........)

**24** වින්දයා කඳුකරය

(01) උතුරු හා දකුණු ඉන්දියානු කොටස් වෙන් වූයේ මේ කඳුවැටියෙනි
(02) තප්ති නදිය ඇරඹෙන්නේ වින්දයා කඳුවැටියෙනි
(03) නර්මදා නදී තෙර සිට යමුනා නදී නිම්නය තෙක් පැතිර තිබේ
(04) උජ්ජේනි හා වේදිසගිරි වැනි ඓතිහාසික ස්ථාන ද ඒ ආශ්‍රිතව තිබේ
(05) බැරෝඩා කපොල්ල එහි බටහිර අන්තයේ පිහිටා තිබේ (..........)

The National e-learning Portal for The General Education

**25** ඉන්දියාවේ සාහිත්‍ය මූලාශ්‍රය

(01) බොහෝ ප්‍රමාණයක් තිබේ

(02) නමුත් විශ්වසනීය මූලාශ්‍ර අඩු ය

(03) රාමායනය සම්බන්ධ සියලු සිද්ධි පුරාවිද්‍යාත්මකව සනාථ වී තිබේ

(04) බොහෝ මූලාශ්‍ර දේවකතා මූල සහිත වේ

(05) 'පුරාණ' ග්‍රන්ථ 18ක් ඇතත් විශ්වසනීය මූලාශ්‍ර ලෙස ඇත්තේ ඉන් දෙකක් පමණි (..........)

අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති(A),(B),(C) හා (D) යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය.නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,
(A)සහ(B) පමණක් නිවැරදි නම්............. 1 ද
(B)සහ(C) පමණක් නිවැරදි නම්............. 2 ද
(C)සහ(D) පමණක් නිවැරදි නම්............. 3 ද
(A)සහ(C) පමණක් නිවැරදි නම්............. 4 ද

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම්............. 5 ද වරහන් තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩණය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A)සහ(B) පමණක් නිවැරදිය. | (B)සහ(C) පමණක් නිවැරදිය. | (C)සහ(D) පමණක් නිවැරදිය. | (A)සහ(C) පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

**26** ඉන්දියාවේ ගංගා පද්ධතිය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) අධිරාජ්‍ය බිහිවීමේ දී ගංගා යමුනා ප්‍රදේශ ඉතා වැදගත් වී ඇත

(B) සින්ධු නදියේ ප්‍රධාන අතුගංගා 7ත් ආවරණය වූ භූමිය 'සප්ත සින්ධු' නමින් හඳුන්වා ඇත

(C) දකුණු ඉන්දියානු ගංගා බොහොමයක් බටහිර දෙසින් මුහුදට එක්වේ

(D) සෝණ නදිය මහා නදියේ අතුගංගාවකි (..........)

**27** ඩෙකාන් සානුව සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) වින්ද්‍යා හා සත්පුර කඳු අතර භූමිය යි

(B) මෞර්ය අධිරාජ්‍යය බිහිවීමේ දී ඉතා වැදගත් වූ භූමියකි

(C) ක්‍රිෂ්ණ තුංගභද්‍රා ගෝදාවරී ආදී ගංගා කිහිපයක් මෙ හරහා ගලා යයි

(D) කොමරින් තුඩුවෙන් නිමා වේ (..........)

**28** ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ ප්‍රභවය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) දකුණු ඉන්දියාවේ ප්‍රභවය වී යැයි ඇලෙක්සැන්ඩර් කණිංහැම් විශ්වාස කරයි

(B) ක්‍රි. පූ. 12 වන සහස්‍රකයේ ඇරඹෙන්නට ඇතැයි විශ්වාස කෙරේ

(C) ඉන්දියාව තුළ ප්‍රභවය වීය යන මතයේ සිටින බහුතරය ඉන්දීය පුරාවිද්‍යාඥයෝ වෙති

(D) ඉනදියාවෙන් පිටත ප්‍රභවය වී ඉන්දුනිම්නයට සංක්‍රමණය වන්නට ඇතැයි විශ්වාස කරන පිරිසක් ද වේ (..........)

**29** මොහෙන්ජොදාරෝව සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) සින්ධු නදිය ආසන්නයේ ස්ථානගත වී තිබේ

(B) ජුදෙයිරෝදාරෝ හා ලර්කානා වැනි නගර ඒ ආසන්නයේ තිබේ

(C) මළවුන්ගේ ගොඩැල්ල යන අරුතින් මේ නාමය ලැබී තිබේ

(D) ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගරය යි (..........)

**30** ඉන්දියානු වේද සාහිත්‍යය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) ඍග් වේදයෙන් හෙළි වන යුගය ඍග් වෛදික යුගය නම් වේ.

(B) සෙසු වේද ග්‍රන්ථ පශ්චාත් වෛදික යුගයේ රචනා වී ඇත.

(C) වේද ග්‍රන්ථ ඉතා විශ්වසනීය ඓතිහාසික මූලාශ්‍රය වේ.

(D) ආයුර්වේදය චතුර්වේදයන්ගෙන් එකකි. (..........)

ප්‍රශ්න අංක 31-35 දක්වා වඩාත් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉරි මත ලියන්න.

**31** 'චෝළ තටාක' නමින් පසුකාලීනව ව්‍යවහාරයට පැමිණියේ

(01) බෙංගාල බොක්ක

(02) සුදර්ශන විල

(03) යශෝධර තටාකය

(04) අරාබි මුහුද

(05) ලෝතාල් නැව් තටාකය (..........)

**32** ගංගා යමුනා නදී නිම්නයෙන් පිටත පිහිටි ජනපදයකි

(01) සූරසේන

(02) කාසි

(03) අංග

(04) අස්මක

(05) කෝසල (..........)

**33** 1498 වර්ෂයේ දී බටහිර ජාතිකයෙකුගේ සම්ප්‍රාප්තිය සමග ප්‍රකටභාවයට පත් ඉන්දීය වරායකි

(01) ගෝව

(02) කොචින්

(03) කැලිකට්

(04) බොම්බේ

(05) විශාකපට්න (..........)

**34** ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ වැසියන් සබඳතා පැවත්වූ බාහිර ශිෂ්ටාචාරයකි

(01) මායා

(02) ඉන්කා

(03) මෙසපොතේමියා

(04) හොවැංහෝ

(05) ඇස්ටෙක් (..........)

**35** ඉන්දුනිම්න වැසියන්ගේ ප්‍රධාන ආර්ථික බෝගය වූයේ

(01) කපු

(02) බාර්ලි

(03) මෑ

(04) කෙසෙල්

(05) යව (..........)

The National e-learning Portal for The General Education

36 සිට 40 තෙක් ප්‍රශ්න යටතේ ප්‍රකාශ 2 බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | නිවැරදිය |
| 2 | නිවැරදිය | වැරදිය |
| 3 | වැරදිය | නිවැරදිය |
| 4 | වැරදිය | වැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|---|
| 36 | කයිබර් දුර්ගය ඉන්දීය ඉතිහාසයට වඩාත් බලපෑම් කළ දුර්ගය යි. | මක්‍රාන් දුර්ගය දෙවැනි වූයේ කයිබර් දුර්ගයට පමණි. | (..........) |
| 37 | දකුණු ඉන්දියවේ දොරටුව සේ හැඳින්වෙන්නේ බෝලාන් දුර්ගයයි. | බෝලාන් දුර්ගය වින්ද්‍යා කඳු ආශ්‍රිතව ඇත. | (..........) |
| 38 | රාමායනය ඉන්දියාවේ ප්‍රධාන සාහිත්‍ය මූලාශ්‍රය යි. | මහාභාරතය වීරකාව්‍යයකි. | (..........) |
| 39 | ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගරය මොහෙන්ජොදාරෝවයි | ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන වරාය ලෝතාල් වරාය යි. | (..........) |
| 40 | ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ බිඳවැටීමට අකුණු ගැසීම් හේතු වී ඇත. | ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ බිඳවැටීමට ආක්‍රමණික සතුරු කණ්ඩායමක් ද හේතු වී ඇත. | (..........) |

The National e-learning Portal The General Education